මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙලිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැකසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම්කර නිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අභිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කරන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා බැරකම් හිලව් නොකළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය සහ පෞද්ගලික අංශයෙන් අයවිය යුතු රු.732,679,823 ක් වූ ණය ශේෂයෙන් රු. 5,294,106 ක බැර ශේෂය අඩුකර රු.727,385,717 ක ශුද්ධ ණය ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය පවත්වාගෙන යාමේ අරමුණ ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධන සංචිත, පොදු සංචිත, සංවර්ධන සංචිත ආදිය පිළිබඳව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

(i) පෙර වර්ෂයේ ගැලපීම් රු. 38,327,278 ක ශේෂයක් ඇතුළත්කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළනය කර තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය වූයෙන් එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහිත විය.

- වර්ෂය තුළ ආදායම් බදු ලෙස රු. 30,000,000 ක් සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එය රු. 25,000,000 ක් ලෙස දක්වා තිබුණි.

- ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වත්කම් මිලදී ගැනීම සඳහා මුදල් ගලායාම් රු.37,941,634 ක් විය යුතු වුවද එය රු.36,160,264 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් ගලායෑම් රු.1,781,370 කින් අඩුවෙන් දක්වා තිබුණි.

- පොලී ගෙවිය යුතු කෙටිකාලීන ණය ගැනීම්වල සමාලෝචිත වර්ෂයේ අවසානයට වැඩිවීම රු. 99,537,720 ක් වුවද එය රු. 86,782,343 ක් ලෙස දැක්වීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 12,755,377 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාල වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගිව ගලපා ඉකුත් වර්ෂයන්හි මූල්‍ය තත්ත්වය නැවත ප්‍රකාශ කිරීම වෙනුවට පෙර වර්ෂවල ගැලපීම් තුලින් ලාභයට වූ රු. 73,242,347 ක බලපෑම සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ රඳවාගත් ඉපයීම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

ආදායම් බදු වියදම් ලෙස ප්‍රවර්තන වර්ෂයේ බදු වියදමට, පෙර වර්ෂයට අදාළ ඌන වෙන් කිරීම්/අධි වෙන්කිරීම් හා විලම්භිත බදු වියදම්/ආදායම හඳුනාගත යුතු වුවත් සංස්ථාවේ බදු වියදම ලෙස ප්‍රවර්තන වර්ෂයේ බදු වියදම් පමණක් හඳුනාගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂයට අදාළ ඌන බදු වෙන් කිරීම රු. 11,536,948 ක් වන අතර එය සංස්ථාව විසින් රඳවාගත් ඉපයුම් සංචිතයට හර කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය රු. 11,536,948 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) විලම්භිත බදු ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාශන තුළ අනාවරණයකර නොතිබුණි. විශේෂයෙන් බදු ගණනයේදී පැනනගින තාවකාලික වෙනස්කම් (Temporary Differences) සහ ස්ථිර වෙනස්කම් (Permanent Differences) හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) මෝටර් රථ හා අනෙකුත් වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් පන්තියට අදාළ සියලු අයිතම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද එකතු වටිනාකම් රු. 1,420,429 ක් වූ මෝටර් රථ හා අනෙකුත් වාහන ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) මෝටර් රථ හා අනෙකුත් වාහන ප්‍රත්‍යාගණනය කළ දිනය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(iii) වත්කම් ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කමේ ධාරණ අගයට වඩා ප්‍රත්‍යාගණන අගය වැඩි වන්නේ නම් එම වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත යුතු අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ "ප්‍රත්‍යාගණන සංචිත" නමින් ශීර්ෂයක් යටතේ ප්‍රත්‍යාගණන ලාභ දැක්විය යුතුව ඇත. එහෙත් මෝටර් රථ හා අනෙකුත් වාහන ප්‍රත්‍යාගණන ලාභය රඳවාගත් ඉපයුම් යටතේ හඳුනාගෙන තිබූ අතර ප්‍රත්‍යාගණන ලාභය වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් මුළු විස්තීර්ණ ආදායම රු.36,015,363 කින් අඩුවෙන් දක්වා තිබූ අතර රඳවාගත් ඉපයුම් සංචිතය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iv) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 183,762,693 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් එම වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

විශ්‍රාම ප්‍රතිලාභ ගිණුම් කැබීම සම්බන්ධ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම පිළිබඳ සාමාන්‍ය විස්තරයක්. ආරම්භක හා අවසාන ශේෂයන්වල වර්තමාන අගය ගැලපීම් විස්තර. වර්තමාන සේවා පිරිවැය. පොළී ආගණිත ලාභ හෝ අලාභ (Actual Gain or Loss) සහ පසුගිය සේවා පිරිවැය යනාදී තොරතුරු හඳුනාගෙන එහි ලාභය හෝ අලාභය ගැලපූ ආකාරය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොග වාර්තා අනුව පැවති නිමි සහ නොනිමි තොගයන්ට වඩා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති නොනිමි සහ නිමි තොග සාවද්‍ය ලෙස රු. 15,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී මුද්‍රණ කටයුතු අවසන් වූ මුද්‍රණ කාර්යයන් දෙකක ඉන්වොයිස් වටිනාකම වූ රු. 41,454,000 ක් ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබූ නමුදු එම මුද්‍රණ කාර්යයන්ට අදාළ මුද්‍රණ පිරිවැයෙන් රු.966,514 ක් අවසන් නොනිමි තොගය තුළද, වටිනාකම රු. 10,898,322 ක් වූ කඩදාසි කිලෝ ග්‍රෑම් 92,117 ක් අමුද්‍රව්‍ය තොගය තුළද ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු11,864,836 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලිපි ද්‍රව්‍ය අලෙවියෙන් ලද ආදායමෙහි ඇතුළත් එකතු කළ අගය මත බදු වටිනාකම වූ රු.31,511,137 ක මුදල ලිපි ද්‍රව්‍ය ආදායම් ලෙස සැලකීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පාසල් පෙළ පොත් මුද්‍රණය කර ගිවිසුම් ගත දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර නොදීම හේතුවෙන් රු.26,007,297 ක ප්‍රමාද ගාස්තු ගෙවිය යුතු බව අනාවරණය වූ නමුදු ඒ සඳහා ගිණුම්වල රු.3,571,658 ක මුදලක් පමණක් ප්‍රතිපාදනය කර තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 04 ට වැඩි එකතුව රු. 82,045,046 ක් වූ ණය ශේෂයක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය වූ රු. 703,301,233 කින් සියයට 11ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගිමි ශේෂය රු. 80.124.336 ක් වූ අතර ඉන් වසර 04 කට වඩා පැරණි බේරුම් නොකරන ලද ණයගිමියන්ගේ වටිනාකම් රු.11.016.563 ක් හෙවත් සියයට 14ක් විය.

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේද තුළ ඇතුළත් වූ සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් අයවීමට හා ගෙවීමට තිබූ ශේෂ පිළිවෙලින් රු. 9.753.427 ක් හා රු.7.460.675 ක් විය. මෙම ශේෂයන් තුළ අවුරුදු 03 ඉක්මවූ ශේෂ පිළිවෙලින් රු.7,989.976ක් සහ රු.5,578.142ක් වූ නමුත් එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති රීති, රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම්
(අ)	1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 59 වන වගන්තිය	ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණු අතර ගින්නක් හටගත් අවස්ථාවකදී ඉන් ආරක්ෂාවීමේ ක්‍රම හා හැඩගැසීම් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් සේවකයින්ට ලබාදී නොතිබුණි.
(ආ)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
(i)	2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරන චක්‍රලේඛය 4.2 වගන්තිය	කණ්ඩායම් ප්‍රවාහනය වෙනුවෙන් හිමිකම් ලබන සංස්ථාවේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 14 දෙනෙකු සඳහා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිලධාරියෙකුට මාසිකව රු. 17.500 බැගින් 2016 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා එකතුව රු. 691.250 ක් ගෙවා තිබුණි.

3.2 වගන්තිය	රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව දරන ලද සත්‍ය ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ හැකි බවට දක්වා තිබුණද සංස්ථාව විසින් සාමාන්‍යාධිකාරීගේ අතිරේක ඉන්ධන වියදම් අනුමැතිය ලැබීමට පෙර ප්‍රතිපූර්ණය කර තිබුණි.
(ii) 2003 ජුනි 02 දිනැති අංක පිරිඩි/12 දරන චක්‍රලේඛයේ 9.4 වගන්තිය	කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථා සේවකයෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් නොකළ යුතු නමුත් කළමනාකරණ අභ්‍යාසලාභී තනතුර දරන නිලධාරියෙකු 2008 අප්‍රේල් 01 දින සිට වයඹ පළාත් සභාවට අනුයුක්ත කර තිබුණි.
(iii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක පිරිඩි/05/2016 දරන චක්‍රලේඛයේ 01, 02 සහ 03 වගන්ති	ප්‍රසාද දීමනා ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු. 53,029,119 ක් ප්‍රසාද දීමනා ලෙස සංස්ථාවේ සභාපතිගේ නිර්දේශය මත පමණක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 943,720 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,111,384 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,167,664 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය රු. 152,393,746 කින්, බෙදා හැරීමේ වියදම් රු. 8,761,123 කින් සහ වෙනත් මෙහෙයුම් වියදම් රු. 7,007,387 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇතිව් තිබුණු නමුත් එය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සිඝ්‍රයෙන් අඩුවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 469,013,635 ක් වූ සංස්ථාවේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.599,107,326 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත හා එහි සංශෝධිත පනත් අනුව සාරාංශ කරන ලද සංස්ථාවේ අරමුණු පහතින් දැක් වේ.

(i) රජය, පළාත් පාලන ආයතන, ලිඛිත නීතියකින් සංස්ථාපිත රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල, පුද්ගලික ආයතන හෝ පුද්ගලයෙකුගේ මුද්‍රණ හෝ ප්‍රකාශන කාර්යයන් ඉටු කිරීම.

(ii) ලිපි ද්‍රව්‍ය හා වෙනත් අනුයාත ද්‍රව්‍ය නිෂ්පාදන කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, මිල දී ගැනීමේ හා විකිණීමේ කාර්යය භාර ගැනීම.

(iii) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන පොත් පත්, අධ්‍යාපනික ආධාරක, පුවත්පත් සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීමේ, බෙදා හැරීමේ, අපනයනය කිරීමේ හා ආනයනය කිරීමේ කාර්යය භාර ගැනීම.

සමාලෝචිත වර්ෂයේදී ඉහත අරමුණු ඉටු කිරීමේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(ඇ) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන පොත්පත්, අධ්‍යාපනික ප්‍රකාශන පුවත්පත් සහරා හා වෙනත් ප්‍රකාශන විකිණීම, බෙදාහැරීම, අපනයනය කිරීම හා ආනයනය කිරීම යන කාර්යයන් තුළින් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා උපයා ගත් ආදායම්, සංස්ථාවේ සමස්ත ආදායමින් සියයට 0.01 සිට සියයට 0.08 දක්වා පරාසයක වූ බැවින් එම අරමුණු ඉටු කර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සහ ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂය තුළදී වූ රු. 1,090,385,915 ක ආදායමක් ලැබී තිබුණු අතර එය වර්ෂයේ සමස්ත ආදායම වූ රු. 1,477,236,807 කින් සියයට 74 ක් වූ බැවින් සංස්ථාව විසින් සිය ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කර නොමැති බවට නිරීක්ෂණය විය.

(ඉ) සංස්ථාවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් 23ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දී පුහුණු වැඩ සටහන් 10 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පුද්ගලික ආයතන දෙකක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම ආයතන වලට ඇයවීමට කිසිදු ණය ශේෂයක් නොමැති බව දන්වා තිබියදී සංස්ථාව විසින් එම ආයතන දෙක සඳහා එකතුව රු. 1,180,993 ක මුදලක් ගෙවීමට ඇති බවට ගිණුම් වල ප්‍රතිපාදන සලසා තිබුණි.

4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිසි පරිදි අලෙවි ඉලක්ක සපුරා ගැනීමට සහ අලෙවි අංශයේ කාර්යයන් නිසි පරිදි ඉටු කර ගැනීමට හැකිවන ආකාරයට සමාලෝචිත වර්ෂය සඳහා අලෙවි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට තීරුකේත (Bar codes) සඳහා වාර්ෂිකව රු. 10,000 ක ලියාපදිංචි ගාස්තුවක් පුද්ගලික සමාගමකට ගෙවමින් සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන අභ්‍යාස පොත්වල තීරුකේත මුද්‍රණය කර තිබුණද එම තීරුකේත භාවිතා කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංස්ථාවේ අලෙවි සැල් සඳහා ලබා නොදීම හේතුවෙන් අලෙවි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) සංස්ථාවට අයත් අලෙවිසැල් 12ක් පැවති අතර එහි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය වෙත විකුණුම් කළමනාකරණයට අදාළ කිසිදු පුහුණුවක් සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂයන්හිදී ලබා දී නොතිබුණි.

(ඈ) අලෙවිසැල්වල විකුණුම් ආදායම වැඩි කිරීම දිරි ගැන්වීම සඳහාත්, සේවකයන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ඔවුන් අභිප්‍රේරණය කිරීමටත් විකුණුම් ඉලක්ක වාර්ෂිකව ප්‍රගාමී ලෙස (Progressively) වැඩි කිරීම යහපත් කළමනාකරණ පරිචයක් වුවද සංස්ථාවේ අලෙවි සැල් හයකට සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ විකුණුම් ඉලක්ක පෙර වර්ෂයට සාපේක්ෂව රු. 1,000,000 සිට රු. 5,500,000 දක්වා අඩු කර ලබාදී තිබුණි.

(ඉ) නරඹකාරී වෙළඳපොළක ක්‍රියාක්මක වන රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් තමන්ගේ අභ්‍යාසපොත්, ප්‍රකාශන ග්‍රන්ථ සහ වෙනත් වාණිජ මුද්‍රණ සම්බන්ධයෙන් වෙළඳපොල සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂයන්හිදී සිදු කර නොතිබුණි.

4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පෙර වර්ෂවල සිට පැවති අලෙවි සැල් දහයෙන් හයක්ම සමාලෝචිත වර්ෂයේ ඉලක්ක ගත විකුණුම් වලින් සියයට 12 සිට සියයට 65 දක්වා පරාසයක සිය අලෙවි ඉලක්ක සපුරා ගෙන නොතිබුණි. අලෙවි සැල් තුනක් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දිගින් දිගටම පාඩු ලබා තිබුණු අතර වාර්ෂික පාඩුව රු. 160.550 සිට රු. 1,556.829 ක පරාසයක් තුළ විය.

(ආ) පාසල් පෙළපොත් මුද්‍රණය කරනු ලබන ලිතෝ අංශයේ ඇති පැරණි යන්ත්‍ර පහක් 2017 වර්ෂයට අදාළ පෙළපොත් මුද්‍රණය කරන කාලසීමාව වන 2016 අගෝස්තු සිට දෙසැම්බර් මාස පහ තුළ යන්ත්‍ර පැය 1999 ක කාලයක් බිඳ වැටීම් නිසා අක්‍රීයව පැවති අතර එයින් පාසල් පොත් මුද්‍රණ කටයුතු වලට බාධාවක් වී තිබුණි.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

විධිමත් පැවරීමකින් තොරව සංස්ථාව සතු පාදුක්ක පානළුවහි පිහිටි ඉඩමෙන් අක්කර 13 රූඩ් 2 පර්චස් 06 ක ප්‍රමාණයක් කර්මාන්ත පුරයක් ඇති කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ඉහළ හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් දස දෙනෙකු ඉදිරි වර්ෂ 03 ක කාලය තුළ විශ්‍රාම යාමට නියමිතව සිටින නමුදු එම තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) තරහකාරී ක්ෂේත්‍රයක් වන මුද්‍රණ ක්ෂේත්‍රයේ මුද්‍රණ ඇනවුම් ලබා ගැනීමට සහ වෙළඳපොළ කොටස වර්ධනය කර ගැනීමට ඉවහල් වන අලෙවි පර්යේෂණ නිලධාරී තනතුර 2016 ජනවාරි 18 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පුරප්පාඩුව පැවැතුණි.

(ඇ) අනුමත නොවූ මුද්‍රණ කාර්යය සහායක (Press Aide) තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේදී සේවකයන් 13 දෙනෙකු ස්ථීර සේවයට බඳවා ගෙන තිබූ අතර එම තනතුර ඇතුලුව අනුමත නොවූ කනිෂ්ඨ පොදු නිෂ්පාදන සේවක තනතුර සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 212 ක් සේවයේ නියුතුව තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සැසඳීමේදී වියදම් අයිතම 29 කට අදාලව සියයට 20 සිට සියයට 140 දක්වා පරාසයන් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සංස්ථාවේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2016 රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

(i) ඉදිරි ගිණුම් කටයුතුවලදී මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) ඉදිරි ගිණුම් කටයුතුවලදී අවශ්‍ය හෙළිදරව් කිරීම් ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

(i) පසුගිය වර්ෂ කිහිපයට අදාළ ආදායම් බදු VAT, NBT, ESC හා PAYEE නොගෙවා පැවති අතර, ඒවා මෙම වසර තුළදී නිරවුල් කිරීම නිසා එය සැසඳුම් කිරීමේදී ගැටළු සිදු විය. කෙසේ වෙතත් මේ වසරේදී ගිණුම්වල අදාළ ගැළපීම් සිදු කරන ලද බැවින් ඉදිරි වසර වලදී අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කරනු ඇත.

(ii)
- ❖ අවසාන ගිණුම්වල මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනයේදී සියලුම වර්ගවල බදුවල බැරකම, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ නමින් වූ එකම ගිණුමක සටහන් කර තිබූ බැවින් මෙම වරද සිදු වී ඇත. ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වාගෙන ගෙවූ බදු ප්‍රමාණය නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් නිරූපණය කිරීමට තරයේ උපදෙස් දී ඇත.
- ❖ දේපළ හා පිරියත සටහනේ සඳහන් රු. 36,160,264/- ක වටිනාකම වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිලට ගැනීම් ලෙස සලකා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.
- ❖ 2016.12.31 දිනට කෙටි කාලීන ණය ගිණුමේ ශේෂය වූ රු. 569,351,345.71/- ක ශේෂය අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා නිවැරදිව යොමු කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

මෙහි බොහෝමයක් නිවැරදි කිරීම් 2014 වසර හෝ ඊට පෙර වර්ෂවල නිවැරදි කිරීම් වන බැවින් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂවල ලාභ/අලාභවලට ගැළපීම් කොට දක්වා ඇත. එසේ කිරීමට ප්‍රමිතයෙන් ඉඩ දෙනු ලැබේ.

(ඈ) (i) 2015 වර්ෂයේ දී මේ සඳහා ප්‍රමාණාත්මක වෙනස් කිරීමක් සිදු නොවූව ද එනම් 2016 ගිණුම් වර්ෂයේ දී ඒ සඳහා නිවැරදි ක්‍රමවේදයකට වෙන් කිරීමක් සිදු කර ඇත.

(ii) සංස්ථා අවසාන ගිණුම් හා එයට සම්බන්ධ ගනුදෙනු වාර්තා වැඩිමනක් Manually සිදුකරන බැවින් අවසන් ගිණුම් සකසා එහි ලාභය ප්‍රකාශ කිරීමට බොහෝ කාලයක් ගත වනු ඇත. ගිණුම් ප්‍රකාශ ඊළඟ වසරෙහි පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. එවැනි තත්වයක් තුළ හා ආදායම් බදු සඳහා 100% ක නිවැරදි වෙන් කිරීමක් සිදු කිරීම අපහසු වන අතර ඒ සඳහා ආසන්න වශයෙන් වෙන් කිරීමක් (Provision) පමණක් සිදු කරනු ලබයි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

(i) මෝටර් රථ හා අනෙකුත් වාහන සියල්ලම ප්‍රත්‍යාගණනය කොට එහි ප්‍රත්‍යාගණන අගය දක්වා ඇත. බයිසිකල් හා අත්කරත්ත යන කාණ්ඩවලට ගැනෙන ඒවායෙහි බොහෝමයක් දැ භාවිතයෙන් ඉවත් කර ඇති බැවින් / ප්‍රයෝජනයට නොගන්නා බැවින් මෑතකදී මිලදී ගත් අයිතමයන්ගේ වටිනාකම සාධාරණ බැවින් පවත්නා කාල සීමාව සමග එහි වටිනාකම් ලබා ගන්නා ලදී.

(ii) මෝටර් රථ හා අනෙකුත් වාහන ප්‍රත්‍යාගණනය කළ දිනය 2016 ජනවාරි මස 13 වේ.

(iii) ප්‍රත්‍යාගණන ලාභය පැහැදිලිව වෙනම ශීර්ෂයක් යටතේ හඳුනා ගැනීමට පහසු වන පරිදි දක්වා ඇත.

(iv) සියලු වත්කම් මේවන විට ප්‍රත්‍යාගණනය කර ඇති අතර එම වාර්තා ලබා ගැනීමේ ප්‍රමාදයක් පැවතුනි. මේ සඳහා මිලියන 02 කට ආසන්න පිරිවැයක් දැරීමට සිදුවනු ඇත.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19**

ඉදිරි ගිණුම් වර්ෂවල එසේ කිරීමට කටයුතු යොදා ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) **අවසන් තොග ගණනය කිරීමේ දෝෂ**

අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා පිරිවැය අංශයෙන් ඉදිරිපත් කළ තොරතුරු ලෙජර් ගිණුම් අංශයේ තොරතුරු සමග සැසඳීමේදී ඒවායේ අඩුපාඩු ඇති බව නිරීක්ෂණය කළ බැවින් නිවැරදිතාවයන් කිරීමට සිදු විය. පිරිවැය අංශය නියෝජ්‍ය මුදල් කළමනාකරු බාරයේ පැවති අතර ඔහු 2016 වසරේ නොවැම්බර් මස විශ්‍රාම ගිය බැවින් දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ වාර්තාවන්ගේ අඩුපාඩු නිවැරදි කර නිමි නොනිමි තොග වටිනාකම් ගිණුම්ගත කරන ලදි.

(ආ) වැඩ අංක 160353 සහ 160370 සඳහා පාසල් පෙළ පොත් මුද්‍රණය නිම කර ඉන්වොයිස් කර තිබුණත් අමුද්‍රව්‍ය ලබා ගැනීම් සම්බන්ධ විස්තර පිරිවැය අංශය වෙත නිවැරදිව යොමු නොවීම නිසා මෙවැන්නක් සිදු වී ඇත. කෙසේ වෙතත් මෙවැනි සිදුවීම් යළි ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ලිපිද්‍රව්‍ය අලෙවියේදී ගනුදෙනුකරු වෙත වෙනමම Tax ඉන්වොයිස් පතක් නිකුත් කරනු නොලබයි. ඒ අනුව අප විසින් ගනුදෙනුකරුගෙන් Vat ලෙස වෙනමම මුදලක් අයකරගෙන හෝ එය ඉන්වොයිස් පතෙහි පෙන්වා නොමැත. එබැවින් එම මුළු ආදායමම සංස්ථා ආරම්භයේ සිටම සංස්ථා ලිපිද්‍රව්‍ය ආදායමක් ලෙස ගිණුම්ගත කර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇත. ලිපි ද්‍රව්‍ය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැට් බදු ගෙවිය යුතු අතර, එය වෙනමම ගණන් බලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

(ඈ) පසුගිය කාලසීමාවේ සංස්ථාවේ පැවති මූල්‍යමය ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ප්‍රමාදයකට මුහුණ දීමට සිදු වූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු හිඟ හිටි බදු මුදල් ගෙවීමට සිදු වූ නිසා අපගේ බැංකු ගිණුම් තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. එම නිසා ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයක් ඇති විය. මේ හේතුවෙන් අපගේ ප්‍රධාන අමුද්‍රව්‍යක් වන ආනයනික කඩදාසි හා අනෙකුත් අමුද්‍රව්‍ය සැලසුම් කළ අයුරින් ලබා ගැනීමට නොහැකි විය.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමා වෙත කරුණු පැහැදිලි කර ලිපි ඉදිරිපත් කිරීම නිසා දඩ මුදල් අය නොකරනු ඇතැයි මූලික බලාපොරොත්තුවෙන් සිටි නිසා සම්පූර්ණ ප්‍රමාද ගාස්තු සඳහා ප්‍රතිපාදන ගිණුම්වලට ඇතුළත් නොකරන ලදි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 5993 සඳහා ලබාදෙන ලද තීරණ අනුව ණය ලබා දීමේ කාල සීමාව විධිමත් කර ඇත. ණය කාල සීමාව ඉක්ම වූ ණය ගැනියන්ට අදාළ මුදල් අයකර ගැනීම සඳහා ගණකාධිකාරී (ආදායම්) විසින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) 2017 වර්ෂය තුළ පැරණි ණය හිමියන් සම්බන්ධයෙන් සොයා බලා සත්‍ය වශයෙන්ම ගෙවිය යුතු ණය හිමි ශේෂයන් සම්බන්ධයෙන් පියවර කිහිපයකින් ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මේ සම්බන්ධයෙන් 2016.06.30 දින සාමාන්‍යාධිකාරීවරයාගේ අත්සනින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද පිටපතක් සහිතව එදිනට අප වෙත ලැබිය යුතු ශේෂය වූ රු. 2,292,752.26 නිරවුල් කරන මෙන් ලිපියක් යවන ලද අතර, එයට මේවන තුරු කිසිදු ප්‍රතිචාරයක් නොමැත. එම ශේෂය පහත දැක්වෙන පරිදි විය.

ජාතික කඩදාසි සංස්ථාවෙන් අයවිය යුතු	- රු. 9,753,427.00
ජාතික කඩදාසි සංස්ථාවට ගෙවිය යුතු	- රු. 7,460,675.00
ජාතික කඩදාසි සංස්ථාවෙන් අයවිය යුතු ශුද්ධ ශේෂය	- රු. 2,292,752.00

2.4 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) ගිනි නිවීමේ උපකරණ පසුගිය වර්ෂයේ පරීක්ෂා කර ඇති බව ප්‍රධාන ආරක්ෂක නිලධාරී විසින් තහවුරු කරන ලද අතර තව දුරටත් ඉදිරියේදී ඒවා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. අනතුරු සංඥා නළාව පෙර සවිකර තිබුණද එය යාවත්කාලීන කර නොමැති අතර තව දුරටත් සොයා බලා ඒවා නිවැරදි කිරීමට ප්‍රධාන ආරක්ෂක නිලධාරීට පවරා ඇත.

ගිනි නිවීමේ උපකරණ භාවිතය හා ආරක්ෂාව පිළිබඳ පුහුණුවක් මෑත කාලයේ සිදු කර නොමැති අතර, ඉදිරි කාලයේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට ප්‍රධාන ආරක්ෂක නිලධාරී වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

(ආ) **i.** **4.2 වගන්තිය**

සංස්ථාවේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ප්‍රවාහන පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත්තේ අප ආයතනය රාජ්‍ය වාණිජ ආයතනයක් වීමත් එය කොළඹින් පිටත ප්‍රදේශයක පිහිටා තිබීමත් සහ අදාළ නිලධාරීන් නිසි වේලාවට රාජකාරී කටයුතුවල යෙදවීමත් යන කරුණු සැලකිල්ලට ගනිමිනි.

මෙම නිලධාරීන් එක් එක් ප්‍රදේශවල පදිංචිව සිටින බැවින් සංස්ථාවේ වාහන 04 ක් යොදා ගනිමින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීම කෙටි කාලයක් තුළ සිදු කළ අතර, බොහෝ නිලධාරීන් නියමිත වේලාවට වඩා ප්‍රමාදව රාජකාරී සඳහා වාර්තා කර තිබුණි. එබැවින් අදාළ නිෂ්පාදන අංශවල රාජකාරී කටයුතු නියමිත වේලාවට ආරම්භ කිරීමට නොහැකි වීමෙන් ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට ද අහිතකර බලපෑම් සිදු විය.

මෙම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කළ අතර, ආයතනයේ අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව මත අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

3.2 වගන්තිය

සාමාන්‍යාධිකාරීවරයා රාජකාරී කටයුතු ඉටු කිරීමේදී මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ලබා ගන්නා අතිරේක ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසු අතිරේක ඉන්ධන සඳහා වියදම ප්‍රතිපූරණය සිදු කරයි. මෙය 2017 මාර්තු මස සිට සිදු කරයි.

ii කළමනාකරණ අභ්‍යාසලාභී තනතුර දරන අධිකාරී මහතා දිගු කාලයක් සංස්ථා සේවයෙන් නිදහස් ව වෙනත් ආයතනයක සේවය කරන බැවින් එම තනතුර දරන්නා දිගු කාලයක් ආයතනයේ සේවය නොකිරීම මත සංස්ථාවට අනවශ්‍ය තනතුරක් සේ සලසා කටයුතු කිරීමට ලිපියක් යවා ඇත. (මෙම තනතුර නව අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් ඉවත් කර ඇත.)

iii 2016 වසරේ පාසල් පෙළ පොත් නිෂ්පාදන කටයුතු වලින් ඉතිරි වූ අපතයන් ලෙස ඉවත් කළ තීරු කඩදාසි විකිණීමෙන් ලද අමතර අදායමත්, සේවක මණ්ඩලය අභිප්‍රේරණය කිරීම තුළින් වැඩි නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීමේ මූලික පරමාර්ථය ඇතිව 2016.12.19 දින සභාපතිතුමාගේ ලිඛිත දැනුම්දීම පරිදි 2016.12.28 දින පෙර වර්ෂයේ පරිදි ප්‍රසාද දීමනා ගෙවන ලදි. ඉන් පසුව එළඹී 2017.01.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අදාළ චක්‍රලේඛ සමග ඉදිරිපත් කරන ලදි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

අවධානය යොමු කර ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) අවධානය යොමු කරනු ලැබේ.

(ආ) අවධානයට ලක් කර ඇත.

(ඇ) 2016 වර්ෂයේ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 10 ක් වුවද සංස්ථාවේ සියලුම සේවකයින් සංඛ්‍යාව ඉලක්ක කරමින් ආකල්ප සංවර්ධන වැඩසටහන් හා අලෙවිකරණය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා පිළිවෙළින් 221ක් සහ 30ක් සහභාගි වී ඇත.

4.2 මතබේදයට තුඩු දෙන කරුණු

i. J. D. C. Graphics System සහ J. D. C. Printing Technologies (pvt) යන ආයතන දෙක එකම සමූහ ව්‍යාපාරයකට අයිති සමාගම් දෙකකි. එකම ව්‍යාපාරික ස්ථානයක පිහිටා ඇත. රු. 1,175,623.00 ක මුදලක් J. D. C. Printing Technologies වෙත ගෙවීමට ඇත. මේ සඳහා 2017 වර්ෂයේ සිට වෙනමම ලෙජර් ගිණුමක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

ii. Sky Line Trading සමාගම සඳහා අපගේ ගිණුම් පොත්වල 2011 වර්ෂය සඳහා රු. 5370.00 ක ශේෂයක් ගෙවීමට ඇති බව සටහන් කර ඇත. එසේ වුවත් මෙම ශේෂය සනාථ කිරීම් පදනම් කර ගෙන අවශ්‍ය ගැළපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

4.3 (අ) 2017 වර්ෂයේදී මෙම ගැටලුව විසඳීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ආ) තරගකාරී නිෂ්පාදනයන් හමුවේ වෙළඳපොළ තරගකාරිත්වයට මුහුණ දීම සඳහා අවශ්‍යතාවයක් ලෙස Bar Code ලබා ගෙන ඇත. තවද සංස්ථාව විසින් ERP පද්ධතියක් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අතර එම පද්ධතිය ක්‍රියාත්මකව තිබුණේ නම් අවශ්‍ය උපාංග ලබා ගැනීමට හැකියාව පවතී. කෙසේ වෙතත් ඉදිරියේදී සුරක්ෂා අංශයේ වැඩ කටයුතු සඳහා නවතම මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගනු ලබන බැවින් එම අංශයේ භාවිත කරනු ලබන Scanner යන්ත්‍රය නිදහස් වීමක් සිදුවන අතර ඊට සමගාමීව මූලික මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඉන්පසු මෙම තීරු කේත භාවිත කිරීමට හැකියාව ලැබෙනු ඇත.

(ඇ) ඉදිරි කාලයේ විකුණුම් කළමනාකරණය සඳහා අදාළ පුහුණුවීම් ලබා දෙනු ලැබේ.

(ඈ) වාර්ෂික අලෙවි ඉලක්ක ලබා දීමේදී සාමාන්‍යයෙන් අලෙවිසැලක පිරිවැය ආවරණය වන පරිදි සංඛ්‍යා ලේඛන සකස් කළද ඒ සඳහා පසුගිය වර්ෂයේ අලෙවිය සිදු වී ඇති ආකාරය සහ මෙම වර්ෂයේ නිෂ්පාදන අංශය සමග සම්බන්ධීකරණයෙන් ලබා ගන්නා සංඛ්‍යා තොරතුරු ද සහිතව සකස් කෙරේ. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර සකස් කළ ඉලක්ක 2016 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස්කම් සහිතව අලෙවිසැල් වෙත ලබා දෙන ලදී. එම ඉලක්ක ලබාදීමේදී 2016 වර්ෂයේ දී අලෙවිසැල් වෙත එම ඉලක්ක ඉටු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලදී. එසේම ඉටු කළ නොහැකි අසීරු ඉලක්ක ලබා දීම තුළ අපේක්ෂිත අලෙවිය සම්බන්ධයෙන් ආරම්භයේ සිට අදාළ සේවකයින් මන්දගාමී වීම වළක්වා ගැනීම පිණිස ප්‍රායෝගිකව ඉටු කළ හැකි තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර ඇත.

දැනට එම ඉලක්ක සපුරාලීමටත්, ඉන් අනතුරුව අවශ්‍ය පහසුකම් ලබා දී ක්‍රමයෙන් අලෙවි ඉලක්ක වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ඉ) ඉදිරි වසරවලදී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) අවධානය යොමු කර ඇත.

(ආ) අවධානයට ලක්ව ඇත.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

කාර්මික සංවර්ධන මණ්ඩලය රාජ්‍ය ආයතනයක් වන බැවින් දැනට ආයතන දෙක අදාළ පාර්ශ්වයන් සමග සාකච්ඡා කර විධිමත්ව පැවරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

4.6 (අ) දැනට ඉහළ තනතුරුවල සිටින බොහෝමයක් නිලධාරීන් එවකට අභ්‍යාසලාභීන් වශයෙන් බඳවාගෙන පුහුණුව ලද හෝ පහත තනතුරුවලට බැඳී සාර්ථකත්වය ලබා සිටි නිලධාරීන් වශයෙන් උසස්වීම් ලද අයවන අතර, ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු සඳහා ද සුදුසුකම ලබන නිලධාරීන් මේ අතර සිටින බව පැහැදිලි වේ. දැනට අභ්‍යාසලාභී තනතුර නොමැති වුවද සහකාර අධිකාරී, ස්ථානභාර නිලධාරී ආදී වශයෙන් උපාධිධාරී නිලධාරීන් බඳවාගෙන පුහුණු කරනු ලැබේ. නමුත් ඉහළ තනතුරු දැරීමට හා වගකීම දැරීමට තවදුරටත් පුහුණු කළ හැකිවන අතර, පළපුරුද්ද ලබා ගැනීම තුළින් පුරප්පාඩු පිරවිය හැකිය. කෙසේ වුවද සේවකයින් බඳවා ගැනීමේ පරිපාටියේ අනුමැතිය පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළ කර අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් තනතුරකට සුදුස්සකු තෝරා පත් කර ගත හැකිය. තවද කනිෂ්ඨ හා මධ්‍යම මට්ටමට බඳවාගත් කළමනාකරුවන් සුදුසුකම් මත උසස් කිරීමෙන් ද පුරප්පාඩු පිරවීමට හැකියාව ඇත.

(ආ) වෙළඳපොළ පරීක්ෂණය සඳහා අලෙවි පර්යේෂණ නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් පර්යේෂණ කාර්යයන් ක්‍රියාත්මක කළ අතර එම සේවකයාගේ ඉවත්ව යාමෙන් පසු එම කටයුතු ක්‍රියාත්මක නොවුනි. එසේ වුවද යම් යම් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා විටින් විට වෙළඳ පර්යේෂණයන් සිදු කෙරේ. සංස්ථා නිෂ්පාදන සම්බන්ධ තීරණයන් ගැනීමේදී එම පර්යේෂණ දත්ත උපයෝගී කර ගනී.

(ඇ) පාසල් පොත් මුද්‍රණ කාල සීමාව තුළ එම මුද්‍රණ කටයුතු පමාවකින් තොරව නිෂ්පාදනය කිරීම සඳහා Unskilled worker තාවකාලිකව මෙතෙක් කල් පිටතින් ලබාගෙන තිබුණි. එසේම එක් එක් නිෂ්පාදනාගාරවල යන්ත්‍ර සූත්‍රවලට ලැබෙන මුද්‍රණ ඇණවුම්වල ධාරිතාව අනුව Unskilled worker කාලීනව වෙනස්වීම් වලට භාජනය කරනු ලබයි.

එබැවින් හඳුනාගත් අවශ්‍යතාවයන් අනුව කොන්ත්‍රාත් පදනම මතද බඳවා ගැනීමටද සිදු වූ අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

අනුමත සේවක සංඛ්‍යාව තුළ Unskilled worker තනතුරු 138 ක් ඇත. මෙම කාණ්ඩයේ සේවක මහතුන්ගේ ඉල්ලීම පරිදි මුද්‍රණ කාර්ය සහායක ලෙස තනතුර සඳහන් කර ඇත. නමුත් තනතුරට අදාළ රාජකාරී වෙනස් කර නොමැත. මෙම නාමික වෙනස සිදු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇත. කනිෂ්ඨ සාමාන්‍ය නිෂ්පාදන සහායක (Junior General Production Assistant) තනතුර 2012.07.02 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත්තේ දැනට සිටින සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ වන අතර ඔවුන් විශ්‍රාම යාමෙන් ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් එම තනතුර අහෝසි වේ.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

මේවන විට මාසික වියදම් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හරහා, අධ්‍යක්ෂ මණ්ඩලය ද දැනුවත් කිරීම තුළින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ අනුව ඉදිරියේදී අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ කාරකයක් ලෙස උපයෝගී කර ගත හැකිවේ.

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 සහ 2014 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. 2015 වාර්ෂික වාර්තාව මුද්‍රණයේ ඇති බැවින් සති කිහිපයක් තුළ කැබිනට් අනුමැතිය සඳහා යැවීමට කටයුතු කරනු ලැබේ.

6. පද්ධති හා පාලනයන්

අවධානය යොමු කරනු ලැබේ.

